40	2022.06.23	නුවරඑළිය	බස් නැවතුම්පල හැටන්	ලාෆ් ගෑස් 12.5kg -12 5kg -08	ව්‍යාපාරික ස්ථානයේ භාණ්ඩ රැස්කර ගැනීම	සගවා තබා ගැනීමරු.15000/-ක දඩයක් නියම කරන ලදී .
41	2022.07.25	ත්‍රිකුණාමලය	කෙලින්වීදිය ත්‍රිකුණාමලය	පෙට්‍රල්	සගවා තබාගැනීම	නඩුපවරා දඩ නියම කිරීම. දඩය 9000/-
42	2022.08.01	ගාල්ල	වක්වැල්ල පාර, ගාල්ල	ගෑස්	මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ LP ගෑස් පාලන මිලට වඩා වැඩි මිළට විකිණීම	නඩු පැවරීම සිදු කරා.දඩ මුදලරු.50000/- නියම කරන ලදී.
43	19.07.2022	බදුල්ල	ආගරතැන්න, පැල්ගහතැන්න	ඉන්ධන(ඩීසල්) 1000 ලීටර්	පුද්ගලික අවශ්‍යතාව ඉක්මවන ප්‍රමාණයකින් ඉන්ධන සන්තකයෙහි තබාගැනීම. 17(3), 58(2)	5000/- දඩ සහ නඩු භාණ්ඩ රාජසන්තක කිරීම.





4.2.6 තරඟ විරෝධී භාවිතයන්ගෙන් වෙළඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සහ යහපත් තරඟයක් ඇති කිරීම

01. ප්‍රමුඛ ස්ථානය අනිසි ලෙස භාවිතා කිරීම සහ ඕනෑම තරඟ විරෝධී භාවිතයක් පැවතීම හඳුනා ගැනීම සඳහා ස්වයං විමර්ශන පැවැත්වීම

<u>ක්‍රියාකාරකම්</u>	<u>2022</u>
විමර්ශන සිදු කරන ලදී	2

02. විධාන අංක 87 ප්‍රකාරව අනුව, වෙළඳපොලේ ඇති බිස්කට්, කේක්, රසකැවිලි (චුවිංගම් ඇතුළත්ව), ස්නානයේදී භාවිතා කරන සබන් සහ චොකලට් වල ප්‍රකාශිත/සහතික කළ උපරිම සිල්ලර මිල නිරීක්ෂණය කිරීම.

<u>ක්‍රියාකාරකම්</u>	<u>2022</u>
කටයුතු කරනු ලබන අයදුම්පත් සංඛ්‍යාව	195

03. වෙළඳපල බුද්ධි තොරතුරු රැස් කිරීම

<u>ක්‍රියාකාරකම්</u>	<u>2022</u>
වෙළඳපොළ බුද්ධි සමීක්ෂණ පැවැත්වීම සහ වාරතා ඉදිරිපත් කිරීම	4

සටහන:

කුකුළු මස්, මස් මිල ගණන්, අඟුරු, දර සහ උදුන මිල ගණන් සම්බන්ධ සමීක්ෂණ සිදුකිරීම

04. වෙළඳපල තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා අධ්‍යයනයක් සිදුකිරීම

<u>ක්‍රියාකාරකම්</u>	<u>2022</u>
අවසන් කරන ලද අධ්‍යයන සංඛ්‍යාව	2
ක්‍රියාත්මක වෙමින් පවතින අධ්‍යයන සංඛ්‍යාව	1

සටහන:

අවසන් කළ අධ්‍යයන බයිසිකල් මිල පිළිබඳ අධ්‍යයනය, ලිපිද්‍රව්‍යවල වෙළඳපාළ මිල ගණන් පිළිබඳ අධ්‍යයනය

ක්‍රියාත්මක වන අධ්‍යයනයන්– ඩයපර් පිළිබඳ අධ්‍යයනය

05. ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු අඩංගු දත්ත සංචිතයක් සංවර්ධනය කිරීම

2023 වර්ෂයේදී පද්ධතිය ස්ථාපනයෙන් අනතුරුව සත්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

06. මාර්ගගත ව්‍යාපාරිකයන් ලියාපදිංචි කිරීම.

2022 වර්ෂයේ ක්‍රියාකාරකම්

මාර්ගගත ව්‍යාපාරිකයින් සඳහා උපදේශන මාලාවක් සැකසීම

07. ජාතික ව්‍යාපාර නාමාවලිය සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව සෑම ව්‍යාපාරිකයෙක් ම අධිකාරියේ ලියාපදිංචි විය යුතු ය.

2022 වර්ෂයේ ක්‍රියාකාරකම්

පද්ධතියක් අතිකිරීමසඳහා වන නිර්ණායක හඳුනා ගැනීමට අධිකාරිය නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන දී.

08. RIA ක්‍රියාත්මක කිරීම

ක්‍රියාකාරකම්	2022
වෙනත් ආයතන වලින් ලද ඉල්ලීම් පදනම් කරගෙන සිදු කරන ලද RIA පවත්නා විධාන සඳහා පවත්වන ලද RIA සංඛ්‍යාව	2

ජාත්‍යන්තර සංවිධාන හඳුනාගැනීම

09. තරඟකාරී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ජාත්‍යන්තර සංවිධාන හඳුනාගැනීම

ක්‍රියාකාරකම	2022
හඳුනාගන්නා ලද සංවිධාන	2
පැමුණුණු වැඩමුලු/ පුහුණු සංඛ්‍යාව	1

10. ආහාර හා සෞඛ්‍ය සම්බන්ධ පාරිභෝගික භාණ්ඩ ප්‍රමිතිකරණය අනිවාර්ය කිරීම

ක්‍රියාකාරකම	2022
හඳුනාගත් නව ආහාර අයිතම	2

සටහන : LPG රෙගියුලේටරය, හෝස් එක සහ ගෑස් කුකරය

11. තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳුන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම

2002 අංක 09 පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ පනතේ ක්‍රියාකාරකම් අනුව භාණ්ඩ හා සේවා සපයන්නන් අතර යහපත් තරඟයක් වැඩිදියුණු කිරීම

<u>ක්‍රියාකාරකම්</u>	<u>2022</u>
පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	10

සටහන : *මහරාජා ව්‍යාපාරය සඳහා EDB- පානීය ජලය, මාර්ගගත ව්‍යාපාරිකයන් සඳහා– WCRD, හෝටල් හා බෙකරිකරුවන් සඳහා වැඩසටහන, Daraz සම්බන්ධ ව්‍යාපාරිකයින් , වෙළඳ ලකණු මඟින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම (ජූලියස් සහ ක්‍රීසි සමාගම සඳහා මාර්ගත සැසියක) පැණිරස කැවිලි ((පිටකොටුව, මරදාන, දෙහිවල, වැල්ලවත්ත)*

4.3 අසාධාරණ වෙළඳ පිළිවෙත් මඟින් අගතියට පත් පාරිභෝගිකයින්ට සහනයක් ලබා දීම.

4.3.1 පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පනතේ 13 සහ 32 වගන්තිවල ලබා දී ඇති විධිවිධාන මත පදනම්ව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි වලට මැදිහත් විය හැකි ය.නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ඇඟවුම් කර හෝ වෙනත් ආකාරයකින් භාණ්ඩය සම්බන්ධයෙන් ලබා දී ඇති වගකීමට අනුකූල නොවන භාණ්ඩ විකිණීම සහ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමසිය හැකිය.

වගු අංක 4: 2022 වර්ෂයේ දී CCU අංශය ලද පැමණිලි

කාරයසාධනය	2022	
ලද පාරිභෝගික පැමිණිලි		2,662
වැසූ ගොනු		
යොමුව		
ආයතනයට	231	
1977 ට (RAIDS)	80	
දිස්ත්‍රික් කාර්යාලයට	67	
වෙනත් අංශයකට	5	
වෙනත්		
ප්‍රතික්ෂේපිත පැමිණිලි	31	
දෙවරක් පැමිණිලි ලැබීම	31	
වෙනත් වැසූ ගොනු	1,154	
වැසූ මුළු ගොනු සංඛ්‍යාව		**1,599**
විධිමත් විමර්ශනයට යොමු කිරීම (නෛතික)		169
විසඳූ පැමිණිලි		783
57 වගන්තිය		-
විසඳමින් පවතින		111
විසඳන ලද		**2,551**

5 වන වගුව: 2022 වර්ෂයේ ලද පැමිණිලි

දිස්ත්‍රික්කය	2021 වර්ෂයේ ඉතිරි පැමිණිලි	ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	සාකච්ඡා කර විසඳා ලද පැමිණිලි	වෙනත් ආයතනයකට යොමු කරන ලද	ප්‍රධාන කාර්යාලයට යොමු කළ	නිර්යාමාර්ග නොගෙන්නා ලද පැමිණිලි	ඉතිරි පැමිණිලි
අම්පාර	0	20	15	0	3	0	2
අනුරාධපුරය	49	151	112	32	18	1	37
බදුල්ල	0	24	18	0	4	0	2
මඩකලපුව	0	8	3	0	1	0	4
ගාල්ල	35	71	67	2	10	0	27
ගම්පහ	8	61	24	1	23	11	10
හම්බන්තොට	0	17	6	0	3	3	5
යාපනය	0	15	11	0	3	0	1
කළුතර	26	31	37	2	11	6	1
මහනුවර	0	89	44	1	17	3	24
කෑගල්ල	0	18	7	2	5	2	2
කිලිනොච්චි	0	3	1	0	0	0	2
කුරුණෑගල	41	74	41	0	8	0	66
මන්නාරම	0	0	0	0	0	0	0
මාතලේ	9	51	30	0	26	0	4
මාතර	54	46	77	0	5	0	18
මොනරාගල	4	43	8	1	3	3	32
මුලතිව්	0	0	0	0	0	0	0
නුවරඑළිය	7	7	3	1	2	0	8
පොළොන්නරුව	24	27	22	0	0	0	29
පුත්තලම	1	3	3	0	0	0	1
රත්නපුර	0	34	14	2	10	1	7
ත්‍රිකුණාමලය	0	3	0	0	1	0	2
වවුනියාව	0	0	0	0	0	0	0
එකතුව	**258**	**796**	**543**	**44**	**153**	**30**	**284**


6 වන වගුව: 2022 වර්ෂයේ දී ක්ෂණික ඇමතුම් ඔන් ලද පමිණිලිවල අවසන් සාරාංශය

දිස්ත්‍රික්කය	මුළු පැමිණිලි සංඛ්‍යාව	සාර්ථක වැටලීම්	අසාර්ථක	විවසන ලද මෙළඳසැල්	CAA අදාළ නොවේ	උපදෙස් ලබා දෙන ලද	හඳුනා නොගත්	ක්‍රියාත්මක නොවන ලද	ශේෂය
කොළඹ	923	175	264	48	5	80	35	607	316
ගම්පහ	622	134	0	26	15	270	14	459	163
හම්බන්තොට	187	84	47	4	1	42	3	181	6
කළුතර	375	112	54	29	45	96	36	372	3
ගාල්ල	304	65	32	13	11	155	13	289	15
මාතර	254	101	0	3	0	132	10	246	8
රත්නපුර	266	97	35	18	2	45	38	235	31
කෑගල්ල	124	41	12	12	5	45	1	116	8
මහනුවර	211	28	75	22	0	29	9	163	48
මාතලේ	78	23	12	4	0	30	7	76	2
අනුරාධපුරය	157	27	74	6	0	38	7	152	5
නුවරඑළිය	134	25	2	1	0	59	1	88	46
මුලතිව්	6	0	0	0	0	6	0	6	0
පොළොන්නරුව	65	20	34	2	1	5	3	65	0
කිලිනොච්චි	11	3	2	1	0	4	0	10	1
වවුනියාව	16	9	0	0	0	5	2	16	0
යාපනය	34	20	0	1	0	12	0	33	1
මන්නාරම	26	14	1	3	0	2	6	26	0
මොනරාගල	261	97	83	15	2	48	8	253	8
ත්‍රිකුණාමලය	37	22	2	1	0	8	4	37	0
බදුල්ල	135	34	0	1	1	89	0	125	10
මඩකලපුව	30	12	3	2	0	13	0	30	0
අම්පාර	85	32	18	7	0	12	3	72	13
කුරුණෑගල	374	120	110	3	15	62	8	318	56
පුත්තලම	168	57	50	2	1	39	1	150	18
එකතුව	**4883**	**1352**	**910**	**224**	**104**	**1326**	**209**	**4125**	**758**

7 වන වගුව: 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව ප්‍රති තරඟකාරී පිළිවෙත් සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම

ක්‍රියාකාරකම්	**2022**
කාලසීමාව තුළ කටයුතු කරන ලද පැමිණිලි සංඛ්‍යාව	47
කාලසීමාව තුළ විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව	36
සභාව වෙත යොමු කරන ලද පැමිණිලි	1
කටයුතු කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව	10

1 වන රූපසටහන : 2022 වර්ෂය සඳහා ක්ෂණික ඇමතුම් අවසන් සාරාංශය



4.4 සාධාරණ මිලකරණය සහතිකවීම

4.4.1 නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය

අධිකාරියේ මිලකරණ සහ කළමනාකරණ අංශය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 14, 18 සහ 19 වගන්තිවල විධිවිධාන යටතේ තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ මඟින් වෙළඳාම සඳහා පහසුකම් සැලසීමට මැදිහත් වේ.

2022 වර්ෂය තුළ ආර්ථික විචල්‍යතා සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී ඉහත විධිවිධාන යොදාගැනීම බලපෑම් ඇති කළේය. ඉන්ධන අර්බුදය, විනිමය අනුපාත උච්චාවචනය, උද්ධමනය

සහ වෙනත් ගැටළු ස්වකීය ව්‍යාපාර අඛණ්ඩව කරගෙන යාමට සහ වෙළඳපොළට භාණ්ඩ ලබා ගැනීමට ව්‍යාපාරිකයින්ට දුෂ්කරතා ඇති කරමින් ආර්ථිකය කෙරෙහි අනර්ථකාරී අන්දමින් බලපා තිබේ. එබැවින් ඉහත සඳහන් රීතීන් මඟින් උපරිම මිල ස්ථාපනය කිරීම අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයීමේ වෙළෙඳපොළ හැකියාවට තර්ජනයක් වීමට ඉඩ තිබුණි. ඒ හේතුවෙන් මිල තීරණය කිරීම සඳහා වෙළඳපල බලවේග ශක්තිමත් කිරීම මගින් පාරිභෝගිකයින්ට වඩාත් පහසුවෙන් භාණ්ඩ ලබා ගැනීම අවධාරණය කර තිබේ.

සටහන: කිරිපිටි, දියර පෙට්‍රෝලියම් ගෑස් (LPG), සිමෙන්ති, තිරිඟු පිටි 2021.10.08 දිනැති 2248/55 ගැසට් නිවේදනය මඟින් නිශ්චිත අයිතම ලැයිස්තුවෙන් ඉවත් කර ඇත.

සම්පූර්ණ යොදය සහිත කිරිපිටි, තිරිඟු පිටි, අයන් බාර් සහ සිමෙන්ති, බෝතල් කළ පානීය ජලය, දේශීය සහල්, බිත්තර, ඩෙංගු ප්‍රතිදේහජනක පරීක්ෂාව සඳහා වන ගාස්තු, ව්‍යුහගත නොවන ප්‍රෝටීන් (NS 01) ප්‍රතිදේහජනක පරීක්ෂණය සහ සම්පූර්ණ රුධිර ප්‍රමාණය යනාදී වෙළඳපල මිල ගණන් සහ පිරිවැය ගණනය කිරීම් පිළිබඳව අධ්‍යයනය කර පනතෙහි වගන්ති 19 සහ 20 යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය ලබා දී තිබේ. (එනම් : විමර්ශනය සඳහා පාරිභෝගික කටයුතු පිලිබඳ සභාවට ලබා දීමට සහ උපරිම සිල්ලර මිල පැනවීමට හෝ ඉවත් කිරීමට එහි නිර්දේශය ලබා ගැනීමට). තවද, අමාත්‍යාංශ සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු බෙදා හැරීම හරහා වෙළඳාමට පහසුකම් සැලසීම යටතේ වැඩිදුර නියෝජනය කිරීම සහ වාර්තා සැකසීම සිදු කර තිබේ.

8 වන වගුව: තොරතුරු ප්‍රචාරණය

අංකය	විස්තරය
1	මිල උච්චාවචනය, පාරිභෝජනය සහ පැවතීම හඳුනාගැනීම සඳහා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම
2	අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා විදේශීය මුදල් වෙන්කිරීමට ප්‍රමුඛතාවය ලබාදීමට 2022 වර්ෂයේ ආනයනික අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා 2022 ප්‍රථම කාර්තුවේ විදෙස් මුදල් අවශ්‍යතාවය (ඇමෙරිකානු ඩොලර් අවශ්‍යතාවය) පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීම.
3	වර්තමාන අර්බුදකාරී තත්වය තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ පැවතීම සම්බන්ධයෙන් වන ගැටළු සහ අභියෝග ඇතුළත් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලද අතර ලෝක ආහාර වැඩටහනට ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ සැකසීම.
4	දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමෙන් දිවයින පුරා අත්‍යවශ්‍ය භාණ්ඩ පැවතීම හඳුනාගැනීම සඳහා සමීක්ෂණ ආකෘතියක් සැකසීම සහ වාර්තාකිරීමේ ආකෘති සකස් කරන ලදී.
5	වෙළඳපොළෙහි එල්පී ගෑස් පැවතීම තහවුරු කරගැනීම සඳහා තොග ඉහළ නැංවීමේ යන්ත්‍රණයක් වැඩිදියුණු කිරීම යෝජනා කරමින් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලදී.

6	ඉන්දියාව සහ වෙනත් රටවලින් ආනයනය කරනු ලබන භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කර බාර දෙන ලදී.
7	ඉන්දීය ණය පහසුකම යටතේ ආනයනය කරන ලද තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යන ලදී.
8	වෙළඳපොළෙහි තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ පවතින බව නිරීක්ෂණයට සහ වාර්තා කිරීමට රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාට සහයෝගය ලබාදීම.
9	වී, බිත්තර වැනි තොරාගත් භාණ්ඩවල මිල ගණන් , බඩඉරිඟු නිෂ්පාදන මිල, බිත්තර නිස්පාදන මිල අයන් බාර්, සිමෙන්ති , පොහොර, පාන් සහ බිස්කට් වල මිල ඇස්තමේන්තු ආදිය සහ දිස්ත්‍රික්ක අනුව මිල ණන් පිළිබඳව වෙළඳපොළ සමීක්ෂණ පැවැත්වීම.
10	බේකරි නිෂ්පාදන, පාන් පිටි, කුකුළු මස්, සිමෙන්ති සහ යකඩ බාර් පිළිබඳ පිරිවැය ඇස්තමේන්තු සකසා බාර දෙන ලදී
11	දෛනික සහ සති පදනම මත එකතු කර, යතාවත් කර සිල්ලර මිලට දිස්ත්‍රික්ක අනුව සිල්ලර මිලට විකිණීම.
12	ආනයනය කරනු ලබන අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳව දත්ත සංචිතයක් පවත්වාගැනීම සහ තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳව මිල ඇස්තමේන්තු සැකසීම.
13	අත්‍යවශ්‍ය භාණ්ඩ වල සිල්ලර මිල සංවලනය, මාසික/ සති ආනයන දත්ත සකස් කර සංසරණය කිරීම.
14	ගබඩා ලියාපදිංචි කිරීම යටතේ ලත් අයදුම්පත් යාවත්කාලීන කරන ලදී.
15	කිරි නිෂ්පාදන, ඉදිකිරීම් උපකරණ, ලිපිද්‍රව්‍ය, තේ සහ බිස්කට්, සබන් සහ ක්ෂාලක ද්‍රව්‍ය නිෂ්පාදකයන් සමඟ එම නිෂ්පාදනවල දක්වා ඇති උපරිම සිල්ලර මිල අනුව නිෂ්පාදනවල මිල ව්‍යුහ පවත්වාගැනීම සම්බන්ධයෙන් පාර්ශ්වීය සාකච්ඡා පවත්වන ලදී.

නිශ්චිත භාණ්ඩවල මිල තහවුරු කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග

9 වන වගුව: නිකුත් කරන ලද නිශ්චයකිරීම් සංඛ්‍යාව

භාණ්ඩය	නිශ්චයකිරීම් සංඛ්‍යාව
ගෑස්	01 (අමාත්‍ය මණ්ඩල තීරණය අනුව)

- මිල රැස්කිරීමේ දී නිරීක්ෂණය කළ මිල විවිධාංගීකරණය මනාව සැලසුම් කිරීම
  - පවත්වන ලද වෙළඳපොළ සමීක්ෂණ සංඛ්‍යාව – 16
  - මිල විවිධාංගීකරණ වාර්තාව සකස් කිරීම් සහ සංසරණය කිරීම් සංඛ්‍යාව– 12
- දිස්ත්‍රික් අනුව වෙළඳපොළ මිලගණක යාවත්කාලීන කිරීම
  - සංසරණය කරන ලද මිල රැස් කිරීමේ වර්තා සංඛ්‍යාව – 143

- බාරදෙන ලද සතිපතා මිල විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව

- ගබඩා ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව– 164

4.5 ආයතනයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම

4.5.1 කාර්ය මණ්ඩල ශක්තිය

වත්මන් ආයතනික ව්‍යුහය අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන අතර සභාපති සහ පූර්ණ කාලීන සමාජිකයින් තිදෙනෙකු ඇතුළු අධිකාරියේ සාමාජිකයින් විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කළ යුතුය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ සමස්ත මෙහෙයුම් කටයුතු භාරව කටයුතු කරන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරුන් සිටියි. දැනට අධිකාරිය පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය, තරඟ ප්‍රවර්ධන අංශය, මිලකරණ සහ කළමනාකරණ අංශය, අනුකූලතා සහ බලාත්මක කිරීමේ අංශය, මූල්‍ය අංශය සහ මානව සම්පත් හා පරිපාලන අංශය යන අංශ 6 කින් සමන්විත වේ.
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලය පහත සඳහන් සේවකයින්ගෙන් සමන්විත වේ.

- පනතේ විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය කරගන්නා ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවය කිරීමට කැමති සාධාරණ වෙළඳ කොමිසමේ සේවකයින්.
- මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අයදුම්පතක් ගොනු කළ අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුවේ සේවකයින් ද උසාවියේදී ඉදිරිපත් කරන ලද බේරුම්කරණ කොන්දේසි අනුව අන්තර්ග්‍රහණය කරගෙන තිබේ.
- පාරිභෝගික කටයුතු අධිකාරියට බඳවාගත් නව කාර්ය මණ්ඩලය.

පාරිභෝගික කටයුතු අධිකාරිය අද මුහුණ දෙන එක් තීරණාත්මක අභියෝගයක් වන්නේ සමස්ත සේවක සංඛ්‍යාවට අනුව එහි සම්පූර්ණ මානව සම්පත් ශක්තිය නොමැති වීමයි. විශේෂයෙන්ම පළාත් මට්ටමින් අධිකාරියේ ඉලක්ක සපුරා ගැනීමට මෙම තත්ත්වය බලපා තිබේ. පුරවා නොමැති තනතුරු සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ අවශ්‍යතාව පාරිභෝගික කටයුතු අධිකාරිය හඳුනාගෙන ඇති අතර, පුරවා නොමැති තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

16 වන වගුව: 2022.12.31 දිනට පාරිභෝගික කටයතු පිළිබඳ අධිකාරියේ සේවක තත්ත්වය

තනතුර	වැටුප් කේතාංකය	අනුමත සේවක සංඛ්‍යාව	වර්තමාන සේවක සංඛ්‍යාව		පුරප් පාඩු
			ස්ථිර	ස්ථිර	
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ					
අධ්‍යක්ෂ ජනරාල්		**1**	**0**	**0**	**1**
අධ්‍යක්ෂවරුන්/ කවුන්සිලයේ ලේකම්		**7**	**5**	**0**	**2**
කළමනාකරණ					
අභ්‍යන්තර විගණක		**1**	**1**	**0**	**0**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (නීති සහ බලගැන්වීම්)			**2**	**0**	**0**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (පාලන සහ මානව සම්පත්)			**1**	**0**	**1**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (මූල්‍ය)			**2**	**0**	**0**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (තරඟකාරීත්ව කළමනාකරණ)		**12**	2	**0**	**0**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (මිලකරණ සහ ප්‍රවර්ධන)			**1**	**0**	**1**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (පාරිභෝගික කටයුතු සහ තොරතුරු)			**0**	**0**	**2**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ප්‍රාදේශීය අධ්‍යක්ෂවරුන්		**12**	**6**	**0**	**6**
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමුපකාර සන්නිවේදන) - තාවකාලික පදනම		**1**	**0**	**0**	**1**
කනිෂ්ඨ කළමනාකරණ					
විගණන නිලධාරී		**2**	**1**	**0**	**1**
පද්ධති පරිපාලක		**1**	**1**	**0**	**0**
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී		**27**	**29**	**0**	**0**
ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී		**1**	**0**	**0**	**1**
ජ්‍යෙෂ්ඨ වෙළඳ පර්යේෂණ විශ්ලේෂක		**1**	**0**	**0**	**1**
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී			**1**	**0**	**1**
රහස්‍ය ලේකම් (සභාපති)			**1**	**0**	**0**

රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්)		1	0	0	1
ජ්‍යෙෂ්ඨ පරිපාලන/ මානව සම්පත් නිලධාරී		1	0	0	1
ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීමේ නිලධාරී		8	3	0	5
ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී		1	1	0	0
බලගැන්වීම්/ මෙහෙයුම්/ ව්‍යාප්ති					
දත්ත සම්බන්ධීකාරක	MA 5-2	1	0	0	1
සංඛ්‍යාලේඛන නිලධාරී		1	1	0	0
වෙළඳපොළ පර්යේෂණ විශ්ලේෂක		1	0	0	1
ප්‍රලේඛන නිලධාරී II		6	3	0	3
පුස්තකාලයාධිපති		1	1	0	0
පිරිවැය නිලධාරී		15	2	0	10
ගිණුම් නිලධාරී			3	0	
පරිපාලන නිලධාරී II		5	3	0	2
විමර්ශන නිලධාරීන්		450	350	0	100
මාධ්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත)		1	0	0	1
කළමනාකරණ සහකාර තාක්ෂණික					
පොත් තබන්නා	MA 2-2	1	0	0	1
ඡායාරූප ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)		1	1	0	0
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)					
පොත් තබන්නා	MA 1-2	50	40	0	10
ඡායාරූප ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)		1	1		
ප්‍රාථමික මට්ටම (පුහුණු)					
රියදුරු		28	24	0	4
ප්‍රාථමික මට්ටම (නුපුහුණු)					
කාර්යාල කාර්ය සහායක		24	21	0	3
කාර්යාල කාර්ය සහායක (කොන්ත්රා ත් පදනම මත)		1	0	0	1
Total		**667**	**507**	**0**	**162**

* කොන්ත්‍රාත්/ අනියම් පදනම මත

Table 3: Summary of Actual Cadre - Dec' 2022

Head Office & District Office

Division	Director General (HM 2-1)	Director (HM 1-1)	Secretary to the CAA Council(HM 1-1)	Deputy Director (MM 1-1)	Asst. Director (MM 1-1)	Asst. Director-Regional Affairs (MM 1-1)	Internal Auditor (MM 1-1)	Audit Officer (JM 1-1)	Senior Accounts Officer (JM 1-1)	System Administrator (JM 1-1)	Senior Investiation Officer (JM 1-1)	Conf. Secretary-Chairman (JM 1-1)	Legal & Enf Officer/ Senior Legal & Enf Officer (JM 1-1)	Senior costing Officer(JM 1-1)	Investigation Officer (MA 5-2)	Statistician Officer (MA 5-2)	Market Research Analysist (MA 5-2)	Documentation Officer(MA 5-2)	Admin Officer (MA 5-2)	Accounts Officer (MA 5-2)	Costing Officer (MA 5-2)	Librarian (MA 5-2)	Cameraman-Contract basis(MA 2-2)	Management Assistant (MA 1-2)	Driver (PL -3)	Office Aide (PL -1)	Total
Head Office	1(Act)	5	1(Act)	2	6	6	1	1	1	1	7	1	7	1	52	1	0	3	3	3	2	1	1	29	13	11	160
District Office	0	0	0	0	0	0	0	0	0	0	22	0	0	0	297	0	0	0	0	0	0	0	0	12	11	10	352
Total	**1**	**5**	**1**	**2**	**6**	**6**	**1**	**1**	**1**	**1**	**29**	**1**	**7**	**1**	**349**	**1**	**0**	**3**	**3**	**3**	**2**	**1**	**1**	**41**	**24**	**21**	**512**

4.5.2 කාර්ය මණ්ඩල සංවර්ධනය

සේවක මණ්ඩලය අදාළ ක්ෂේත්‍රයෙහි සංවර්ධනය කිරීම ස්වකීය සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට දායකත්වය සපයන බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සලකනු ලැබේ. 2022 වර්ෂයේ දී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන පහත සඳහන් පරිදි වේ.

වගු අක 12 : 2022 වර්ෂයේ දී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසටහන්

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් සම්මන්ත්‍රණ පවත්වන ලදී.			
දිනය	සේවක කාණ්ඩය	විෂයයන්	සහභාගීවූවන්සංඛ්‍යාව
2022.08.01	All Categories	කාර්යාල ක්‍රම	87
2022.08.06	MM 1-1/ JM 1-1	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	
	MA 5-2/ MA 1-2	ගිණුම් පද්ධති/ මූල්‍ය	
2022.08.07	MM 1-1/ JM 1-1	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	
	MA 5-2/ MA 1-2	ගිණුම් පද්ධති/ මූල්‍ය	
2022.08.08	සියලුම කාණ්ඩ	විෂය දැනුම	
2022.08.10	සියලුම කාණ්ඩ	කාර්යාල ක්‍රම/ ආයතන සංග්‍රහය	
2022.08.15	සියලුම කාණ්ඩ	විෂය දැනුම/ කාර්යාල ක්‍රම	
2022.08.16	MM 1-1	පොදු/ පාලන සහ රාජ්‍ය ප්‍රතිපත්ති/ සාමාන්‍ය කළමනාකරණය	
කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන			
2022.11.03	JM 1-1 to HM 2-1	රැකියා විස්තරය	15
2022.11.05	සියලුම කාණ්ඩ	කාර්යාල ක්‍රම	79
2022.11.06	සියලුම කාණ්ඩ	සේවක එලදායීතාව	48
2022.11.10	සියලුම කාණ්ඩ	පාලන සහ රෙගුලාසි	65
2022.11.16	සියලුම කාණ්ඩ	මුදල් රෙගුලාසි	59
2022.11.23	සියලුම කාණ්ඩ (සෑම අංශයකින් ම නිලධාරියෙකු බැවින්)	තොරතුරු දැනගනීමේ පනත	14
2022.11.25	සියලුම කාණ්ඩ (සෑම අංශයකින් ම නිලධාරියෙකු බැවින්)	මිලයනය සහ බදුකරණය	15

4.5.3 කාර්යමණ්ඩල උත්ප්‍රේරණය සහ සුබසාධනය

කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසන්න සහ හිතකර සේවා පරිසරයක් ලබා දීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, සංස්කෘතික හා ආගමික වැඩසටහන්, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම , සේවකයන්ට පිළිගැනීමක් ලබාදීම වැනි පියවර කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

4.5.4 පාරිභෝගික කටයතු පිළිබඳ අධිකාරි පනත සංශෝධනය කිරීම.

පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක සමඟ සාකච්ඡාව සිදු වෙමින් පවතී.

4.6 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමු කිරීම් ප්‍රධාන වශයෙන් ප්‍රතිතරඟකාරීත්ව චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මඟින් බලය පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිලගණන් , වෙළඳපොළ අඩුපාඩු සහ වෙළඳපොළ හැසිරවීම් විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී භාණ්ඩ අලෙවි කටයුතු මෙන් ම සේවා සැපයිය යුතු මිල ගණන් නිර්දේශ කිරීමට සභාව වෙත පැවරී තිබේ.

19 වගුව : 2022 වර්ෂයේ දී පැමිණිලි සම්බන්ධ ප්‍රගතිය සහ ප්‍රති තරඟකාරී පිළිවෙත් යටතේ සිදු කළ උපරිම සිල්ලර මිල සම්බන්ධ කරුණු

	2022 වර්ෂයේ ලැබියයුතු මුළු මුදල්	**2022 දක්වා ක්‍රියාත්මක**	**තීරණය කර විසඳූ හෝ සභාව විසින් 2022 වර්ෂයේ දී ඉදිරිපත් කළ වාර්තා**
ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	01	03	04
උපරිම සිල්ලර මිල සම්බන්ධයෙන් ලද ගැටළු සංඛ්‍යාව	16	02	14



5. විගණනය කළ මූල්‍ය වාර්තාව




පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		2022.1.231 දිනට අගය	2021.12.31දිනට නැවන ප්‍රකාශිත අගය	
වත්කම්		රු. 000'	රු. 000'	
ජංගම වත්කම්				
මුදල් සහ මුදල් සමාන දෑ	SCH -1	72,420	58,067	
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	SCH - II	66,712	21,297	
භාණ්ඩ තොගය/ තොග	SCH -III	3,309	2,351	
වෙනත් ජංගම මූල්‍ය වත්කම්	SCH -1V	9,654	9,316	
		152,096	**91,031**	
ජංගම නොවන වත්කම්				
ආයෝජන		371,292	349,523	
පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම		79,345	77,208	
ජංගම නොවන වෙනත් මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය)	SCH - V	13,036	14,969	
කුලී පදනමට ගත් ගොඩනැඟිලි	SCH -VI	700	725	
වත්කම්, පිරියත සහ උපකරණ	SCH -VII	96,575	27,041	**
		560,948	**469,467**	
මුළු වත්කම්		**713,044**	**560,498**	
වගකීම්		-		
ජංගම වගකීම්				
උපචිත වියදම්	SCH -VIII	40,602	49,679	**
ගෙවිය යුතු මුදල් සහ වෙනත් වගකීම්	SCH -IX	2,240	1,290	
		42,842	**50,969**	
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	SCH -X	76,560	87,890	
මුළු වගකීම්		**119,402**	**138,859**	
මුළු ශුද්ධ වත්කම්		**593,641**	**421,638**	
ශුද්ධ වත්කම්/ ස්කන්ධ		-		
විලම්භීත ආදායම	SCH -XI	11,498	14,207	
ප්‍රාග්ධන හා සංචිත	SCH -XII	582,144	407,431	**
		593,641	**421,638**	
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධ		**593,641**	**421,638**	

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 05 සිට 12 දක්වා වන අතර හා පිටු අංක 13 සිට 58 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සටහන් ද මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනුකලන කොටසක් වේ. මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් කරනු ලැබේ



අධ්‍යක්ෂ මූල්‍ය
ඩබ්ලිව්.එම්. ප්‍රියන්ත



අධ්‍යක්ෂ ජනරාල්
ජේ.එම්.සී.ජයන්ති විජේතුංග



සභාපති
ශාන්ත නිරිඇල්ල



පූර්ණ කාලීන සාමාජික
එඑස්.ඒ.එච්.ලලින් ආර් ද සිල්වා

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

		2022.1.231 දිනට	2021.12.31දිනට නැවන ප්‍රකාශිත අගය	
		රු. 000'	රු. 000'	
ආදායම				
පුනරාවර්තන ප්‍රදාන		541,500	505,000	
දඩ මුදල් මඟින් ලද ආදායම්		37,141	13,570	
වෙනත් ආදායම්	SCH -XIV	60,030	27,137	**
		638,671	**545,707**	
වියදම්				
පුද්ගල පඩිනඩි	SCH-XV	(416,439)	(413,152)	**
ගමන් වියදම්	SCH -XVI	(7,815)	(8,360)	**
සැපයුම් සහ පරිභෝජන	SCH -XVII	(17,064)	(9,672)	**
නඩත්තු	SCH -XVIII	(11,628)	(9,754)	**
ගිවිසුම්ගත සේවා	SCH -XIX	(61,807)	(54,186)	**
ක්ෂයවීම්	SCH-XX	(7,710)	(11,403)	
වෙනත් මෙහෙයුම් වියදම්	SCH -XXI	(31,973)	(31,988)	**
මූල්‍ය පිරිවැය	SCH -XXII	(114)	(92)	
බේරුම් කිරීම්			-	
මුළු වියදම්		**(554,550)**	**(538,606)**	
කාලසීමාව සඳහා මුළු ශුද්ධ අතිරික්තය/ (හිඟ මුදල)		**84,120**	**7,101**	#
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්				
විලම්බිත ආදායම		7,710	11,403	
පාරිතෝෂික වෙන්කිරීම් හිඟය		10,102	-	
අතිරික්තය ප්‍රති ඇස්තමේන්තුගත කිරීම		72,780	-	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**174,713**	**18,505**	

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	2022.1.231 දිනට අගය	2021.12.31දිනට නැවන ප්‍රකාශිත අගය
	රු. 000'	රු. 000'
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් විලින් ලද අතිරික්තය/ (හිඟය)	**174,713**	**18,505**
ගැළපුම්		
ක්ෂයවීම්	7,710	11,403
පාරිතෝෂික වෙන්කිරීම්	(10,097)	6,378
ක්‍රමක්ෂයවීම්	25	25
ප්‍රති ඇස්තමේන්තුගත අතිරික්තය	(72,781)	-
විලම්භිත ආදායම	(7,710)	(11,403)
පොළී ආදායම	(55,321)	(22,955)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට ප්‍රථම මෙහෙයුම් ලාභය	**36,539**	**1,953**
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
ගෙවීම් ඉහළයාම - සටහන I	(8,126)	1,227
වෙනත් ජංගම වත්කම් පහළයාම - සටහන II	(7,497)	7,700
පාරිතෝෂික ගෙවීම්	(1,233)	2,629
ලැබූ ලාභ	16,105	20,717
මෙහෙයුම් කාර්යයන්ගෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**35,788**	**34,226**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
පිරියත සහ උපකරණ මිලදීගැනීම	(4,464)	(5,390)
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	(2,137)	(4,747)
ආයෝජන ඉහළයාම	(21,767)	(34,105)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(28,368)**	**(44,242)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන	5,000	6,000
දීර්ඝ කාලීන ණය ඉහළයාම/ පහළයාම (කාර්ය මණ්ඩල ණය)	1,933	(2,626)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය	**6,933**	**3,374**
මුදල් හා මුදල් සමාන දැහි ශුද්ධ ඉහළයාම/ (අඩුවීම)	**14,353**	**(6,642)**
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	**58,067**	**64,709**
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**72,420**	**58,067**

1. ගිණුම් සඳහා සටහන්

1.1 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන පාරිභෝගික සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 වන දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/58/02 ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය "A" උප කාණ්ඩයේ නියාමන නියෝජිතායතනයන්හි "A" කාණ්ඩයේ ආයතනයක් වශයෙන් වර්ග කරන ලදී.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ වෙළඳාම විධිමත් කිරීමයි.

1.3 2022 වර්ෂය අවසානය වන විට අධිකාරියේ සේවක සංඛ්‍යා ව 520 ක් විය.

1.4 **සුවිශේෂී කොටස් හිමිකාරීත්වය / ස්කන්ධ**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදලෙන් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායටමන් 1/3 ක මුදලින් ඇති කරන ලද අරමුදලේ ශුද්ධ ශේෂ මඟින් අරමුදලේ ස්කන්ධ නිරූපණය කෙරේ.

1.5 **රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් පවතින විට එය රජයේ ප්‍රදානයක් වශයේන හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතම හා සම්බන්ධයක් පවතියි නම් එය වර්ෂය සඳහා වන ආදායම වශයෙන් හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමක් සඳහා වන්නේ නම් අදාළ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලයට සමාන අගයක් ආදායම වශයෙන් සලකා ගණනය කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මූල්‍යමය නොවන ප්‍රදාන ලබන විට එම ප්‍රදානයන් වත්කම්වල නාමික අගයන් වශයෙන් ගැනෙන අතර සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීවකාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් සඳහන් කෙරේ. රාජ්‍ය ප්‍රදාන හා සම්බන්ධ වත්කම් සහ මූල්‍යමය නොවන ප්‍රදානය සාධාරණ අගයකට විලම්භීත ආදායම වශයෙන් ශේෂපත්‍රයේ සඳහන් කර තිබේ.

2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳව කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් පිළියෙළ කර තිබේ.

2.2 ඓතිහාසික පිරිවැය පදනම මත සහ සිදුවිය හැකි ගිණුම්කරණ වෙනස්වීම් පාදක කරගෙන මූල්‍ය ඇස්තමේන්තු සකස් කර තිබේ.

2.3 දඩ මුදල් ආදායම

2.3.1 අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගන්නා බැවින් පෙර ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදි. එම නිසා දඩ මුදල් උපයනු ලබන ආදායමක් වශයෙන් සලකන ලද අතර දඩ මුදල් ආශ්‍රිත සියලු වියදම් සහ ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ

2.3.2 සමුච්චිත අරමුදල රු. **63, 190,913.00**

මෙමඟින් 2012/21/31 දිනට සමුච්චිත අරමුදල (දඩ ආදායම, නඩු කටයුතු සඳහා ගාස්තු, නශ්‍ය භාණ්ඩ අලෙවිය සහ ආයෝජන පොළිය) නියෝජනය කරන අතර මෙම මුදල ආදායමේ කොටසක් ලෙස සලකන බැවින් එය සංචිතයන්හි කොටසකි. එබැවින් එම මුදල සංචිත යටතේ දක්වනු ලැබේ.

2.3.3 අධිකාරිය විසින් දඩ මුදල් ආදායම් වශයෙන් මුදල් ලැබුවද අදාළ වැටලීම සිදුකළ පාරිභෝගික කටුයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරියා විසින් ලබා දෙන ලද නඩු අංක අදාළ අධිකරණය විසින් මුදල් එවීමේදී ලබා දෙනු ලබන අංක හා අදාළ තොරතුරු එකිනෙකට වෙනස්වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේදී ම දඩ මුදල් වශයෙන් හඳුනා නොගැනෙන අවස්ථා පවතියි. එම මුදල් සත්‍ය වශයෙන් ම අධිකාරිය සතුවිය යුතු මුදල් ද නැතහොත් අධිකරණය විසින් වැරදීමකින් එවන ලද මුදල් ද යන්න සත්‍යාක්ෂණය කරන තෙක් සාමාන්‍යයෙන් අවිනිශ්චිත - දඩ මුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊළඟ වර්ෂය අවසන් වනතෙක් නිශ්චිතව හඳුනා නොගන්නේ නම් අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

2.3.4 පූර්ව අත්දැකීම් අනුව හඳුනා නොගත් දඩමුදල් ආදායමන් ඉතා ඉහළ ප්‍රමාණයක් ලැබිය යුතු දඩ මුදල් ලෙස නිරූපණය වේ.

2.4 මුදල් වර්ෂය

අධිකාරියෙහි මූල්‍ය වර්ෂය දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන ලිත් වර්ෂය සලකනු ලැබේ.

3. වත්කම් පදනම් සහ ඒවායේ අගය තක්සේරුකිරීම්

3.1 දේපළ පිරියත සහ උපකරණ

3.1.1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ස්වකීය ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ගිණුම් ඇස්තමේන්තු සඳහා අපේක්ෂිත හඳුනාගැනීම් වශයෙන් පිරිවැය ආකෘතිය තෝරාගනු ලබයි. (SLPSAS 7). එබැවින්, වත්කම් ශුන්‍ය අගයට ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය නොවේ.

3.1.2 දේපළ පිරියත සහ උපකරණ ආදියෙහි අගය දැක්වීමේදී ඒවායේ ශුද්ධ සමුච්චිත ක්ෂයවීමට දේපළ, පිරියත සහ උපකරණ කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ද අන්තර්ගත වේ. දේපළෙ, පිරියත සහ උපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇති විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිනොගෙන නව කොටස් ආශ්‍රිතව ජීව කාලය සහ ක්ෂයවීම හඳුනා ගනියි. අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

3.1.3 වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා ඕනෑම වියදමක් දරමින් සිදු කරනු ලබන මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් සඳහා වන පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වැය වන පිරිවැය වේ.

3.1.4 කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ වත්කම්වල ජීවකාලය ඉහළ නැංවීම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකනු ලැබේ.

3.2 ක්ෂයවීම්

අදාළ මාසයේ සිට ආරම්භ වන අධිකාරිය විසින් අත්පත්කරගෙන ක්ෂය කරන ලද භාවිතය සඳහා පවතින වත්කම් වේ.

3.2.1 දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ජීවකාලය මත පිරිවැය කපාහැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ගැළපෙන පරිදි ක්ෂය ප්‍රතිපාදන සලසා තිබේ.

කාර්යාලීය ගෘහභාණ්ඩ සහ සවිකිරීම්		10%
කාර්යාල උපකරණ		10%
පරිගණක උපකරණ		20%
පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණ	(අස්පෘශ්‍ය වත්කම්)	20%
මෝටර් වාහන		20%
කාර්යාල කාමර බෙදා වෙන්කිරීම් (පාටිෂන්)		20%
පාරිභෝගික නොවන භාණ්ඩ		10%

3.2.1 ක්ෂය ගණනය කිරීම් සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඍජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

3.2.2 පුස්තකාල පොත් සඳහා .ක්ෂයකිරීම් සිදු කරනු නොලැබේ.

3.2.3 වර්ෂයට අදාළ ක්ෂය විලම්භීත ගිණුමට බැර කරනු ලැබේ.

3.3 **ගොඩනැඟිලි පරිශ්‍ර - කුරුණෑගල**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 01 ක මුදල ගෙවීම වසර 40 ක වඩා වැඩි කාලයක් සඳහා ක්‍රමක්ෂය කර තිබේ.

3.4 ණය ගැතියන් සහ ලැබිය යුතු මුදල්

උපලබ්ධි වීමට ඇති ඇස්තමේන්තුගත වටිනාකම් මත ණය ගැතියෝ සහ ලැබිය යුතු මුදල් සඳහන් කර තිබේ.

3.6 **මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් අර්ථ දැක්වේ.

3.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල් සහ බැංකු තැන්පතු අන්තර්ගත වේ.

3.7 ස්ථාවර තැන්පතු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ස්ථිර තැන්පතු ආයෝජන යනේ වර්ග කරනු ලැබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අත්දැකීම් අනුව ස්ථිර තැන්පතු අදාළ කාලපරිච්ඡේදය තුළදී ආපසු ලබාගෙන නොමැති අතර ස්ථිර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථිර තැන්පතු අගය මත ගණනය කරනු ලැබේ.

4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 ගෙවිය යුතු මුදල්

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කර තිබේ.

4.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ක්‍රම දෙකක් පවතින අතර එම ක්‍රම දෙක සඳහා ම දායකත්වය දැරිය යුතු ය.

4.2.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මකින් ඔබ්බට ගිය පසු- රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. 2018 වර්ෂයේ සිට, LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' මගින් අවශ්‍ය වන පරිදි දැනට සිටින සියලුම සේවකයින් සඳහා සූත්‍ර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂිත ගණනය කරන ලදී. එනම් සේවක ප්‍රතිලාභ මත LKAS 19 ට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවා ආරම්භයේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා තිබේ. නමුත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමූහයේ ආයතන සඳහා, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ සේවකයකු සම්බන්ධයෙන් වන වගකීම පැන නගින්නේ අඛණ්ඩ සේවා කාලය වසර 5ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නිරූපිත පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් පිටතට ගලායාම වට්ටම් කිරීමෙන් වන අතර අදාළ වගකීම් වල නියමයන්ට වලට ආසන්නව කල්පිරීමට නියමයන් පවතියි. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම රඳා පවතින්නේ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් සූත්‍ර පදනමක් මත තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත ය.

2020 දෙසැම්බර් 31 වන දිනට සියලුම සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා ප්‍රතිපාදන රුපියල් **87,890,140.38** විය. අර්ථ දක්වා ඇති විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නිර්ණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ. මෙම උපකල්පනවල ඕනෑම වෙනස්කමක් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ ධාරණ අගයට බලපානු ඇත.

		2021
වට්ටම්ගත පොළී අනුපාතය		9.70%
වැටුප් වැඩිවීමේ අනුපාතය		7.72%
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය		3.62%
විශ්‍රාමගැනීමේ වයස		62 Years

පාරිතෝෂික ප්‍රතිපාදන වෙන් වශයෙන් ආයෝජනය කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අනුමැතිය ලබාගෙන තිබේ. වසර පහකට වැඩි සේවා කාලයක් ඇති සේවකයින් සඳහා පාරිතෝෂිත ආයෝජනය ගණනය කර තිබේ. පහත සඳහන් කර ඇත්තේ 2021/12/31 වන විට පාරිතෝෂිත ආයෝජනයේ සාරාංශය සහ ආයෝජනය කළ යුතු ශේෂයයි.

	Rs
2021.12.31 දිනට වසර 5 ට වඩා සේවා කාලයක් සහිත සේවකයන් සඳහා පාරිතෝෂික වෙන්කිරීම්	75,077,937.86
සමුච්චිත පොළිය සහිතව 2021.12.31 දිනට කරන ලද ආයෝජන	**77,208,306.23**
2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන	-

4.2.2 නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත සේවකයින් ආවරණය කරමින් ආයතනය විසින් ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා දී තිබේ. සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% බැගින් වූ මුදල් අධිකාරිය විසින් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

4.3 අවිනිශ්චිත වගකීම්

4.3.1 2020.12.31 දිනට පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව නඩු 18 ක් ගොනු කර තිබූ අතර අදාළ අධිකරණය අනුව පහත ලෙස වර්ග කළ හැකි ය.

අධිකරණය	නඩු සංඛ්‍යාව
ශ්‍රේෂ්ඨාධිකරණය	06
අභියාචනාධිකරණය	06
හාධිකරණය	02
දිස්ත්‍රික් අධිකරණය	04
මුළු සංඛ්‍යාව	18

මෙම නඩු අතරින් විශාල ප්‍රමාණයක් ගොනුකර ඇත්තේ පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගිකයින් වෙත ලබා දෙන ලද තීරණ වලට එරෙහිවය ඇතැම් නඩු අධිකාරිය විසන් පළ කරන ලද ගැසට් පත්‍රවලවල වගන්ති වලට පටහැනි වේ.කෙසේ නමුත් අගතියට පත් පාර්ශවයන් රැසක් අධිකාරියේ තීරණය අවලංගු කිරීම, සංශෝධනය කිරීම, හෝ පළ කරන ලද ගැසට් පත්‍ර අවලංගු කිරීම අපේක්ෂා කරන බැවින් අවිනිශ්චිත අගය ප්‍රමාණනය කර නොමැත.

4.3.2.1 පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා තාක්ෂණය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිත සමාගම SICPA වන අතර එමඟින් යම් භාණ්ඩ ප්‍රවාහනය විද්‍යුත් උපකරණයක් ආධාරයෙන් හඳුනා ගැනීම සිදු කෙරේ. නමුත් ගිවිසුම්ගත පරිදි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් එම ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පැන නැඟුණු ආරවුල බේරුම් කිරීම සඳහා අයදුම්පතක් ගොනු කර තිබේ..

4.3.2.2 ක්‍රියාත්මක නොකිරීම සඳහා හේතුව

2014/02/24 දිනැතිව විධාන අංක 49 නිකුත් කිරීමෙන් අනතුරුව නිශ්චිත භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරිය දැනුවත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් ද පැවැත්විණි. එම විධානය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡා අසාර්ථක වූ බැවින්, ශ්‍රී ලංකා වතුර බෝතල් නිෂ්පාදකයන්ගේ සංගමය , බීම වර්ග නිෂ්පාදකයන්ගේ සංගමය සහ රූපලාවන්‍ය නිෂ්පාදන නිෂ්පාදකයින් විසින් 2014/08/14 දින අභියාචනාධිකරණයේ (CAA/Writ/281/2014) ඉල්ලීමක් ගොනු කර ඇති අතර මෙම නඩුව මේ වන විටත් අභියාචනාධිකරණයේ විභාගවෙමින් පවතියි.

4.3.2.3 SICPA විසින් රු. බිලියන 2.716 ක් හෝ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි මුදලක් හෝ විකල්ප වශයෙන් රුපියල් බිලියන 3.887 ක් විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි මුදලක් සහ හිමිකම් කියන ලද හානි සඳහා පොලිය සහ බේරුම්කරණයේ සියලු පිරිවැය ඉල්ලා සිටින ලදී.

4.3.2.4 ඒ අනුව බේරුම්කරණ නඩුව අවසන් අතර බේරුම්කරණ ප්‍රදානය 2021/12/31 දිනට ගෙවිය යුතුය.

5. **ආදායම**

ආදායම හඳුනාගැනීම

පාරිභෝගික අධිකාරිය වෙත ගලා ඒ යැයි අපේක්ෂිත ආදායම් ප්‍රමාණය හඳුනාගෙන ඇතිනම්, ආදායම විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි ය.

පොළී ආදායම

නාමික පොළී අනුපාතය භාවිතා කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කරනු ලැබේ. ස්ථාවර තැන්පතුවල සාමාන්‍ය පොළී අනුපාතය 20.5% වේ.

රජයේ ප්‍රදාන

ප්‍රදාන හිමිවේ යැයි සහතික කරගෙන සහ අදාළ සියලුම කොන්දේසි අනුකූල වේ යැයි සලකා රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ. ප්‍රදානයන් වියදම් අයිතමයකට සම්බන්ධ වන්නේ නම් (පුනරාවර්තන ප්‍රදාන) එය එම කාලය සඳහා ආදායමක් වශයෙන් සලකනු ලැබේ. ප්‍රදානයන් වත්කම් අයිතමයයක සම්බන්ධ වන්නේ නම් (ප්‍රාග්ධන ප්‍රදාන) එය විලම්භිත ආදායමක් වශයෙන් සලකා අදාළ වත්කමෙහි ජීව කාලය පුරා ආදායම සමාන අගයන්ගෙන් නිකුත් කෙරේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මූල්‍යමය නොවන ප්‍රදාන ලබාගන්නා විට වත්කම් සහ ප්‍රදාන දළ වශයෙන් නාමික අගයන් සේ සලකා වත්කමෙහි අපේක්ෂිත ජීව කාලය සඳහා ආදායම් ප්‍රකාශයට ගණනය කරනු ලැබේ. (*/IAS 20)

	2022.12.31 දිනට අගය	2021.12.31දිනට නැවන ප්‍රකාශිත අගය
	රු.	රු.
උපලේඛනය - I		
මුදල් හා මුදල සමාන දෑ		
ලංකා බැංකුව	54,126,545	53,421,304
මහජන බැංකුව	18,204,941	4,547,789
සුළු මුදල් (දිස්ත්‍රික්කාර්යාලය)	82,228	94,535
සුළු මුදල් පාලනය (ප්‍රධාන කාර්යාලය)	6,679	3,500
	-	-
	72,420,393	**58,067,128**
උපලේඛනය - II		
වෙළඳ හා වෙනත් ලැබීම්		
මෙහෙයුම් කටයුතු සඳහා අත්තිකාරම් (Sub Sch II- A)	3,374,533	3,286,208
ලැබියයුතු තැන්පතු	1,899,999	1,599,999
ලැබියයුතු ස්ථාවර තැන්පතු පොළී	42,749,429	11,229,661
ලැබියයුතු දඩ	9,552,837	3,741,081
ලැබියයුතුපාරිතෝෂික අරමුදල් පොළිය	9,135,525	1,440,230
	66,712,322	**21,297,179**
උපලේඛනය- IV		
වෙනත් ජංගම මූල්‍ය වත්කම්		
ආපදා ණය (Sub Sch IV-A)	9,218,459	9,147,514
වෙනත් ණය (Sub Sch IV-B)	435,750	168,250
	9,654,209	**9,315,764**
උපලේඛනය- V		

වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්		
ආපදා ණය (Sub Sch IV-A)	13,035,994	14,969,273
	-	-
	13,035,994	**14,969,273**

උපලේඛණය - IX	**2022.12.31 දිනට**	**2021.12.31 දිනට නැවත ප්‍රකාශිත අගය**
ගෙවියයුතු මුදල් හා වෙනත් වගකීම්	**RS**	**RS**
ආපසු ගෙවනු ලබන තැන්පතු	381,545	331,545
ණය සඳහා අඩුකිරීම්	4,242	4,242
විගණනය සඳහා වෙන්කිරීම්	1,804,000	954,000
හඳුනා නොගත් දඩ	50,000	-
	2,239,787	**1,289,787**

උපලේඛනය - XI

විලම්බිත ආදායම

2011	14,207,362	(4,338,513)
භාණ්ඩාගාරප්‍ර දාන	5,000,000	6,000,000
වර්ෂය සඳහා ක්ෂය කිරීම්	(7,709,862)	(11,403,405)
ප්‍රත්‍යාගණනය - ක්ෂයකිරීම	-	23,949,280
	11,497,500	**14,207,362**

උපලේඛනය- XII

සංචිත

ආදායම් සහ වියදම් ගිණුම		
සමුච්චිත අරමුදල (2011.12.31)	-	63,190,913
වරෂය ආරම්භයේදී ශේෂය	407,430,836	381,466,418
පෙර වර්ෂයේ ගැළපීමේ ශුද්ධ ඉතිරිය	-	(11,722,833)

වර්ෂය සඳහා මුළු විස්තිර්ණ ආදායම	174,713,120	30,227,340
ප්‍රත්‍යාගණන ලාභය 2018&2019	-	(55,731,002)
	582,143,956	**407,430,836**

උපලේඛනය - II-A	**2022.12.31 දිනට**	**2021.12.31. දිනට නැවත ප්‍රකාශිත අගය**
මෙහෙයුම් අත්තිකාරම්	**රු.**	**රු.**
අත්තිකාරම් සහ සැපයීම්	12,500	-
උපායදුන මුදල් - H/O	1,655,424	1,650,010
උපායදුන මුදල් - දිස්ත්‍රික් කාර්යාලය	1,138,380	1,115,015
ඉන්ධන අග්‍රිම - දිස්ත්‍රික් කාර්යාලය	568,228	521,183
	3,374,533	**3,286,208**

උපලේඛනය- IV-B		
වෙනත් ණය ප්‍රවර්තන වර්ෂය)	**-**	
උත්සව අත්තිකාරම්	435,750	168,250
	435,750	**168,250**



6. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඊඒඕ/බී/සීඒඒ/ එප් එස්/2022 මෙම අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 ජූනි 27 දින

RECEIVED CHAIRMAN'S OFFICE

සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ත්වාගණනය කළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 කන්න්ඩායගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉකුත් වර්ෂයේදී ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම වශයෙන් රු.12,669,891 ක් ගිණුම්ගත කර තිබුණු අතර ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර නිදහස් කර ගැනීම හේතුවෙන් ලද පොලී ආදායම රු.10,059,248 ක් වී තිබුණි. ඒ අනුව වැඩිපුර ගිණුම්ගත කර තිබුණු රු.2,610,643 ක පොලී ආදායම ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. 3 ප්‍රකාරව අසීකානුයෝගීව ගලපා නොතිබීමෙන් ලැබිය යුතු පොලී ගිණුමේ ශේෂය සහ රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වර්ෂයට අදාල පාරිතෝෂික ප්‍රතිපාදනය ගණනය කිරීමේදී සේවකයින්ගේ සේවා කාලය සම්බන්ධයෙන් පූර්ණ වර්ෂයක් සම්පූර්ණ නොවූ අවස්ථාවන්හිදී පූර්ණ වර්ෂයක් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය ගණනය කිරීම හේතුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනය රු. 7,146,199 කින් වැඩියෙන් සහ පාරිතෝෂික අයි වෙන් කිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන වශයෙන් රු.371,291,985 ක් සහ පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම් වශයෙන් රු.79,344,883 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනට පැවති ස්ථාවර තැන්පතු ඒ ආකාරයෙන් වර්ගීකරණය කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) විගණනයේ ගණනය කිරීම අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.57,438,109 ක් වුවද , එය රු.55,320,428 ක් වශයෙන් රු.2,117,681 ක් අඩුවෙන් ගිණුම්ගත කර නිබුණි.

(ඉ) 2021 වර්ෂයේ අතිකාල වියදම් සඳහා ප්‍රතිපාදනය නොකල රු.152,601 ක්වූ අතිකාල වියදම් සමාලෝචිත වර්ෂයේ උපචිත අතිකාල වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) විගණනයට ඉදිරිපත් වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව සහ විගණනයේ ගණනය කිරීම අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අතර රු.7,709,862 ක වෙනසක්ද, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අතර රු.1,932,802 ක වෙනසක්ද, මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අතර රු. 4,223,417 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇතිබව මම නිගමනය කලහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික්වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා 2015 වර්ෂයේදී 1977 දරන පාරිභෝගික විමසුම් සේවා (1977 Interactive Mobile Service) මෘදුකාංගය වෙනුවෙන් අධිකාරිය විසින් රු.5,401,428 ක් සහ මෙම ව්‍යාපෘතිය ජනතාව වෙත ප්‍රචාරණය කිරීම සඳහා රු.3,786,942 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, තාක්ෂණික ගැටලු පැනනැගීම සහ භාණ්ඩ මිලගණන් යාවත් කාලීන නොකිරීම, සියලු දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධ කිරීමෙන් දත්ත ඇතුලත් කිරීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් ඇති නොකිරීම, පැමිණිලිකරු වෙත කෙටි පණිවිඩයක් මගින් මාර්ගගත පැමිණිල්ලේ අංකය හා විමර්ශනයේ ප්‍රගතිය දැනුම්දීමට ක්‍රමවේදයක් සකස් නොකිරීම වැනි දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු වී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් රු. 200,000 ක් පිරිවැය වූ තොග කළමනාකරණ මෘදුකාංගයක්, රු.250,000 ක් පිරිවැය වූ දඩ මුදල් සහ උපායදුත මුදල් කළමනාකරණ මෘදුකාංගයක් සහ රු.54,000 ක් පිරිවැය වූ වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් 2015 සහ 2017 වර්ෂවලදී මිලදී ගෙන තිබුණු අතර එම මෘදුකාංග මෙම වාර්තාවේ දිනය දක්වාම භාවිතයට ගෙන නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30 ක් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ අතර මෙම වාර්තාවේ දිනය වන විටත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.

(ආ) පනතේ 10 වගන්තිය අනුව භාණ්ඩ ලේබල් කිරීම සම්බන්ධයෙන් එක් කාර්තුවකට දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් බැගින් වර්ෂය තුල දැනුවත් කිරීමේ වැඩසටහන් 100ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණි.

(ඇ) පනතේ 27 වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් නිරණය කරනු ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දකුම අධිකාරයෙහි ලියාපදිංචි විය යුතු බවට දක්වා තිබුණ ද අධිකාරිය විසින් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා පාරිභෝගික අධිකාරි පනතේ 13 සහ 32 වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වී. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකයකට සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල වන ලෙස භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශනය කල හැකිය. කෙසේ වුවද. 2022 දෙසැම්බර් 31 දින වන විට 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුල දිස්ත්‍රික්කවලට ලද පැමිණිලි වලින් පැමිණිලි 284 ක් හා ප්‍රධාන කාර්යාලයට ලද පැමිණිලි වලින් පැමිණිලි 1078 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල දිවයින පුරා වැටලීම් 23,280 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර, එයින් වැටලීම් 13,980 ක් එනම් 60% ක් සිදුකර තිබුණි. කොළඹ, නුවර, කලුතර,ගාල්ල, බදුල්ල, නුවරඑලිය යන දිස්ත්‍රික්ක 06හි ඉලක්කගත වැටලීම් ප්‍රමාණයෙන් 50% කට අඩු වැටලීම් ප්‍රමාණයක් සිදුකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල ආනයනික හා දේශීය නිෂ්පාදිත භාණ්ඩවල ගුණාත්මකභාවය හා එම භාණ්ඩවලට අදාල ප්‍රමිති නියාමනය කරන ආයතනවලට සම්බන්ධ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) පරිගණක ආශ්‍රිත ක්‍රමවේදයක් තුළින් අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිල අධීක්ෂණය කිරීම සඳහා වර්ෂය තුල භාණ්ඩ 40 ක් තෝරා ගෙන ඒවායේ පිරිවිතර සකස් කිරීමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 4ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුල එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණි.

(ඌ) පාරිභෝගික අධ්‍යාපනය හා දැනුවත්භාවය යන අරමුණු යටතේ පාසල් ආශ්‍රිත පාරිභෝගික කව 50 ක් පිහිටුවීමට සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කර තිබුණද, ඉන් පාරිභෝගික කව 7 ක් පමණක් පිහිටුවා තිබුණි.

(එ) ප්‍රති - නරඟකාරීත්වය සහ අසාධාරණ වෙළඳ පරිවයන්ගෙන් නිෂ්පාදනයන් සහ වෙළඳුන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික කතිකාවත් (Public and Private Dialogue) පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඒ) වැඩ තහනම් කිරීම්වලට යටත් වී ඇති නිලධාරීන්ගෙන් අධිකාරියට අයවිය යුතු රු. 320,942 ක ආපදා ණය ශේෂයන් වර්ෂ 5කට අධික කාලයක සිට අය නොවී පවතින අතර, එම ශේෂ අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි .

(ඔ) එක් එන් දිස්ත්‍රික්ක ප්‍රධානීන් වෙත නිකුත් කර ඇති උපයෝගිත මුදලින් රු. 160,526 ක මුදලක් වර්ෂ 05 කට අධික කාලයක සිට පියවා නොතිබූ අතර, එම මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඕ) අනාරක්ෂිත හා කත්ත්වයෙන් බාල නිෂ්පාදන වලින් පාරිභෝගිකයන් සුරක්ෂිත කරලීම අරමුණු කර ගනිමින් අධිකාරිය විසින් හඳුනාගත් නිෂ්පාදන කීපයක් සඳහා ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීමට තීරණය කර තිබුණු අතර ඒ සඳහා ස්විට්සර්ලන්තයේ Sicpa Security Solution SA සමාගම සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුම්කට එළඹ තිබුණි. මේ පිළිබඳව අධිකාරිය විසින් 2014 පෙබරවාරි මස 24 දින අංක 1851/1 දරණ ගැසට් පත්‍රය මඟින් අංක 49 වෙනි විධානය නිකුත්කර තිබුණි. කෙසේ වුවද, ඉහත කී විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කර තිබුණු අතර ඒ අනුව විධාන අංක 49 හි ක්‍රියාකාරීත්වය මහා අධිකරණය මඟින් වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් Sicpa Security Solution SA සමාගම සමඟ එළඹී ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට අධිකාරියට නොහැකිවී තිබුණි.

ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් Sicpa Security Solution SA සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුමේ 3.3.2 වගන්තිය අනුව සම්පූර්ණ ආයෝජන

මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් හානි වෙනුවෙන් ගෙවන ලෙස ඉල්ලා 2018 ජූලි 30 වන දින ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ (International Chamber of Commerce) බේරුම් කරණ නඩුවක් ගොනු කර තිබුණි. එහි අවසාන ප්‍රදානය 2022 මැයි 10 දින නිකුත් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් Sicpa Security Solution SA සමාගම වෙත රු.බිලියන 2.716 ක් ද ඇ.ඩො. 325,000 මුදලක් බේරුම්කාර ගාස්තුව වශයෙන්ද ගෙවියයුතු විය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විදේශීය සමාගමක් සමග ගිවිසුම් ගත වීමට පෙර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධයෙන් අදාල හාණ්ඩ නිෂ්පාදන සමාගම් පදනම් කරගත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ බවට විගණනයේදී තහවුරු නොවිය. බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ2022 ජූලි 07 දින CHC/626/22/ARB අංක දරන පෙත්සමක් ගොනු කර තිබුණි.

(ක) 2022 ජූනි 10 දින දක්වා පැවති ස්ථාවර තැන්පතු ශේෂයන් ඉහළ පොලී අනුපාතයක් යටතේ නැවත ආයෝජනය කර තිබුණු අතර රු.14,259,010 ක් වටිනා ස්ථාවර තැන්පතුවක් එසේ නැවත ආයෝජනය නොකිරීම හේතුවෙන් අධිකාරියට රු.1,651,867 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 2ක් ,සහකාර අධ්‍යක්ෂ තනතුරු 6 ක් ,නීතිය හා සවිබල ගැන්වීමේ නිලධාරී තනතුරු 5ක් සහ විමර්ශන නිලධාරී තනතුරු 100 ක් පුරප්පාඩු වීම හේතුවෙන් පනතේ ප්‍රධාන අරමුණු කර්යක්ෂමව ඉටු කර ගැනීම කෙරෙහි නිලධාරී පුරප්පාඩු අහිතකර ලෙස බලපා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2.2 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධ සභාපතිතුමාගේ නිරීක්ෂණ හා යෝජිත ක්‍රියාමාර්ග

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වගණනය කල මතය සඳහා පදනම

(අ (පහත (ඈ) හි සඳහන් දෝෂය හේතුවෙන් වැඩිපුර ගිණුම් ගත කර තිබූ පොලි ආදායම ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 3 ප්‍රකාරව අතීතනුයෝගීව ගැලපීම සිදු කිරීමට කටයුතු කරමි.

(ආ) විවක්ෂණ ගිණුම්කරණ සංකල්පය (Prudence) අනුව වත්කම් සහ අදායම්)වැඩියෙන් (අධිතක්සේරු නොකළයුතු අතර, වගකීම් අවතක්සේරු නොකළ යුතුය .පාරිතෝෂික යනු ආයතනයේ වගකීමකි .ඒ අනුව සේවා කාලය වර්ෂයක් නොඉක්මවුවද එම සේවකයා එම වර්ෂයේදී සේවයේ රැඳී සිටියා යන්න උපකල්පනය කල යුතුය .එමෙන්ම සේවකයා විශ්‍රාම යන/සේවයෙන් ඉවත්වී යන අවස්ථාවන්වල ගෙවීම සඳහා එම මුදල තැන්පත් කල යුතුව ඇත.එසේ නොවුනහොත් සේවකයන් විශ්‍රාම යන/ඉවත්වී යන විට ගෙවිය යුතු ප්‍රමාණයට වඩා තැන්පත් ප්‍රමාණය අඩු වේ. එබැවින් විවක්ෂණ ගිණුම්කරණ සංකල්පය සහ මෙම කරුණු මත පිහිටා ප්‍රතිපාදන පුරෝකථනය කල යුතු බැවින්, එය අධිතක්සේරුවක් සේ සැලකිය නොහැක.

(ඇ) **ආයෝජන**

2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරි පනතේ 49 වගන්තිය අනුව අධිකාරියේ අරමුදලක් තිබිය යුතුය යන්න තීරණය කර ඇත. ඒ අනුව එම වගන්ති යටතේ ඇති ප්‍රතිපාදන අනුව අධිකාරිය වෙත ලැබෙන මුදල් මහජන බැංකුවේ ගිණුම් අංක 014100120110475 දරන එකතු කිරීම් ගිණුමට එක්රැස් කරනු ලබයි. එසේ එක්රැස් වන මුදල්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වඩාත් වාසිදායක පොලි අනුපාතිකයක් යටතේ රාජ්‍ය බැංකු වෙත ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කරනු ලැබීය. එම කොටස මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන ලෙස සඳහන් කරනු ලැබ ඇත. ඒ අනුව රු.371,291,985ක මුදල එසේ තැන්පත් කරනු ලැබූ ආයෝජනය වේ.

පාරිතෝෂිත අරමුදල් ආයෝජන

1983 අංක 12 දරන පාරිභෝගික ආරක්ෂණ පනත හා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති

අංක 19 අනුව සේවා කාලය වසර 5 ඉක්මවූ සේවකයන් සඳහා ඔවුන් රැකියාවෙන් ඉවත් වන විට ඔවුන්ගේ සේවා කාලය සඳහා පාරිතෝෂික මුදල් ගෙවිය යුතුය. ඒ අනුව සේවකයන් ආයතනයට බඳවා ගත් දින සිට වාර්ෂිකව පාරිතෝෂික මුදල් සඳහා වෙන් කිරීම කරනු ලබයි. එසේ කරනු ලබන වෙන් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වඩාත් වාසිදායක පොලි අනුපාතිකයක් යටතේ රාජ්‍ය බැංකු වෙත ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරනු ලැබීය. එම ආයෝජන පාරිතෝෂික අරමුදල් ආයෝජන (GFI) ලෙස මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇත. (මෙය ගිණුම් සටහන් අංක 4.2.1 යටතේ දක්වා ඇත.) ඒ අනුව රු.79,344,883ක මුදල එසේ තැන්පත් කරනු ලැබූ පාරිතෝෂික අරමුදල් ආයෝජන වේ.

(ඇ) 2021 වර්ෂයට අදාලව අඩුවන පොලි අදායම පෙර වර්ෂයේ රඳවා ගත් ඉපයීම් වලට ගැලපීම සිදු කල යුතු වුවද එය 2022 වර්ෂයේ පොලි අදායමට ගැලපීම හේතුවෙන් මෙම වෙනස සිදු වී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරමි

(ඉ) 2021වර්ෂයේ ප්‍රතිපාදනය නොකළ රු -/152,601.ක් වූ අතිකාල වියදම 2022වර්ෂයේදී ගෙවා ඇත .එය උපචිත අතිකාල වියදම් ගිණුමට හර කර ඇත .ඉන් පසුව මෙම ප්‍රමාණයෙන් පෙර වර්ෂයේ රඳවාගත් ඉපයීම් වලට ගලපා ඇත .(රඳවාගත් ඉපයීම හර කොට උපචිත අතිකාල වියදම බැර (ඒ අනුව උපචිත අතිකාල වියදම් ගිණුම තුලනය වී යනු ඇත. එම නිසා සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණය අඩුවෙන්ද රඳවාගත් ඉපයීම් ප්‍රමාණය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමක් සිදු වී නොමැත.

(ඊ) 2022 වර්ෂයේ විගණකාධිපති විසින් පෙන්වා දී ඇති පරිදි එම ආකෘතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකසා ඉදිරිපත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.4

(අ) 1977 කෙටි දුරකථන අංකය පාරිභෝගික පැමිණිලි ලබා ගැනීම සඳහා වර්තමානයේ දී ද සාර්ථකව භාවිතා කරනු ලබයි. පැමිණිලිකරු වෙත විමර්ශනයේ ප්‍රගතිය දැනුම් දීම සඳහා නියමු ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කිරීමට වර්තමානයේ කටයුතු කරමින් පවතී.

ඊට අතිරේකව මේ සඳහා වත්මන් ආර්ථික, සමාජ අවශ්‍යතාවයක් හඳුනා ගනිමින් හා පාරිභෝගික අධිකාරි පනතේ අරමුණු වඩාත් ඉහල මට්ටමින් ඉදිරි අවශ්‍යතාවයද හඳුනාගනිමින් පාරිභෝගික තෘප්තිය ඉහල මට්ටමින් ලබාදීම සඳහා සියලුම ආංශික ඒකාබද්ධතාවයන් සහිතව නව මෘදුකාංගයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු මේ වන විට සැලසුම් කරමින් සිටී.

(ආ) මෙහි සඳහන් මෘදුකාංග සියල්ල ගිණුම්කරණ තොරතුරු පද්ධතිය හා සම්බන්ධ මෘදුකාංග වන

අතර ගිණුම්කරණ පද්ධතිය මිලදී ගැනීමත් සමග මිලදී ගත් ඒවා වේ. ඒ අනුව ගිණුම්කරණ පද්ධතිය ක්‍රියාත්මක වන අතර උපාය දූත මුදල් හා අනෙකුත් පද්ධතීන් සම්බන්ධව සේවක පුහුණු වීම්ද, අමතර වැඩ කටයුතුද කර තිබූ අතර අධිකාරියේ පද්ධති පරිපාලන හා අනෙකුත් නිලධාරීන් නොවුයෙන් ඒවා යාවත්කාලීන කිරීම අතපසුවීමක් වී ඇත. කෙසේ වෙතත් පද්ධති පාලක මේ වන විටදී බදවාගෙන ඇති අතර මෙම මෘදුකාංග මගින් මූලික දත්ත යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ස්ථාපිත කිරීමට මේවනවිට කටයුතු කරමින් සිටී. දැනට අර්ධවශයෙන් ක්‍රියාත්මකවන මෘදුකාංගද එම පද්ධතියට අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාව පිළිබඳ තොරතුරු තාක්ෂණ විශේෂඥයින්ගෙන් (IT Experts) විමසන ලදුව, ඔවුන් විසින් එම මෘදුකාංග ඒකාබද්ධ කල හැකි බව තහවුරු කර ඇත. ඒ අනුව මෙම මෘදුකාංග කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ඒකාබද්ධ කර භාවිතයට නියමිතය.

2.3 වෙනත් කරුණු

(අ) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සම්බන්ධව සිදුකර ඇති සංශෝධනයන් නව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2022.07.21 වන දිනැති ලිපිය මඟින් වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇති අතර, ඊට අදාලව අමාත්‍ය මණ්ඩලය පත්‍රිකා අංක අපම 23/0771/627/013 දරන සහ 2023.04.18 දිනැතිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ සංශෝධනය කිරීම යන මැයෙන් අමාත්‍ය මණ්ඩලය සංදේශය වෙළෙඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 2023.05.02 පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය 2023.05.09 දිනැතිව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි පිටපතක් (ඇමුණුම 05) අධිකාරිය වෙත යොමු කර ඇති අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය.

(ආ) 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 10 වගන්තිය යටතේ භාණ්ඩ ලේබල් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන පිළිබඳව, දැනුම්වත් කිරීමේ වැඩසටහන් එක් කාර්තුවකට 25ක් බැගින් 2022 වර්ෂය තුළ 100ක් සිදුකිරීමට සැලසුම් කොට තිබුණි.

ඒ අනුව අදාළ වර්ෂය තුළ නිකුත් කර ඇති විධාන අංක 83, 84 හා 85 පිළිබඳව ව්‍යාපාරික ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා අංක CAA/CA&I/EDU/MP/04/2022-03 හා 2022.08.25 දිනැති ලිපිය (ඇමුණුම 07) මගින් අධ්‍යක්ෂ පාරිභෝගික කටයුතු හා තොරතුරු විසින් සියලු

පළාත් සහකාර අධ්‍යක්ෂවරු සහ සියලු දිස්ත්‍රික් ප්‍රධානීන් දැනුම්වත් කරන ලදී. ඒ අනුව ඉහත සඳහන් විධානයන් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පවත්වන ලදී .එයද ඇතුලත්ව 2022 වර්ෂය තුළ උක්ත කරුණට අදාළව පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය 27 කි.

දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ දී භාවිත කරන පරිගණක ගත ඉදිරිපත් කිරීම් (presentation) මගින් මෙම කාර්ය වඩාත් ඵලදායීව, කාර්යක්ෂමව හා අවම පිරිවැයකින් සිදුකල හැකි බව තහවුරු වීමත් සමග 10 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නව විධාන පිළිබඳව වෙන් වෙන් වශයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවක් නොමැති බව නිරීක්ෂණය විය.

එසේම නිකුත් කරනු ලබන නව විධානයන් සම්බන්ධයෙන් වන තොරතුරු දැනට භාවිත අත් පත්‍රිකාවන් මගින් ද පාරිභෝගික හා ව්‍යාපාරික ප්‍රජාව වෙත සන්නිවේදනය කිරීමට තිරණය කරන ලදි .එමෙන්ම නිකුත් කරනු ලබන සෑම විධානයක් පිළිබඳවම මුද්‍රිත අත් පත්‍රිකා මගින් තොරතුරු සන්නිවේදනය කිරීමේ ඇති ප්‍රායෝගික දුෂ්කරතා හඳුනාගෙන ඊට පිළියමක් ලෙස QR කේතයන් බාගත කර ගැනීම මගින් නව නීති රීති පිළිබඳව ව්‍යාපාරික හා පාරිභෝගික ප්‍රජාව පහසුවෙන් දැනුම්වත් කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

(ඇ(පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කරමින් පවතින අතර ,ඒ සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත .ඒ අනුව වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ දී ලබාගත යුතු දත්ත හා ආවරණය විය යුතු ක්ෂේත්‍ර හඳුණාගැනීම සඳහා 2022 වර්ෂයේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා කාලසීමාව තුළ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නියමු ව්‍යාපෘතියක් සිදුකරන ලදි .වෙළෙඳ අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව අමාත්‍යංශ මට්ටමින් 2023 වර්ෂයේ ජුනි මස අග වනවිට මෙම වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගය සහ දත්ත පද්ධතිය සකස් කිරීමේ පළමු අදියර අවසන් කිරීමට නියමිතය.

(ඈ) 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ඒ ඒ වර්ෂයේ අවසාන දිනය වන විට ලියාපදිංචි කර විසඳීමේ කටයුතු අවසන් නොකළ පැමිණිලිවල එකතුව පහත දැක්වේ. මෙම සියලු පැමිණිලි අදාළ වර්ෂයේ අවසානය වන විට ලියාපදිංචි කර ගොණුගත කර අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පැවති පැමිණිලි වේ. එම සියලු පැමිණිලි අදාළ වර්ෂයට පසු වර්ෂය තුළ නිසි ක්‍රමවේදය අනුව අවශ්‍ය පියවර ගෙන කටයුතු අවසන් කර ඇත.

වර්ෂය	එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනය වන විට ලියාපදිංචි කර ගොණුගත කර අදාළ යාමාර්ග ගනිමින් පැවති ක්‍රි පැමිණිලි ගණන	මැයි 2023 මාසය අවසන් වන විට ක්‍රියාමාර්ග ගනිමින් පැවති පැමිණිලි ගණන
2018	430	0
2019	364	0
2020	572	0
2021	474	0
2022	1047	7

සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට යම් පැමිණිලි ප්‍රමාණයකට අවසාන විසඳුම ලබා නොදුන්නද සෑම පැමිණිල්ලක්ම ලියාපදිංචි කිරීමත් සමග පැමිණිල්ල සම්බන්ධයෙන් පියවර ගැනීම ආරම්භ වේ. 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාමාර්ග ගනිමින් පැවති ලිපිගොණු වලින් ගොණු 1040 ක කටයුතු අවසන් කර ඇති අතර තවත් ගොණු 07 ක පමණක් කටයුතු අවසන් කිරීමට ඇත.2022 පෙර සියලුම වර්ෂවල පැමිණිලි සම්බන්ධයෙන් පාරිභෝගික පැමිණිලි ඒකකය ක්‍රියාමාර්ග ගෙන අවසන් කර ඇත.

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුළ දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබුණු පාරිභෝගික සහන පැමිණිලි වලින් ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව තිබූ පැමිණිලි 284 ක් සම්බන්ධයෙන් වන වර්ථමාන තත්වය ඇමුණුම 06. හි දක්වා ඇත.

(ඉ) පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශය විසින් 2022 වර්ෂය ආරම්භයේදී දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වැටලීම් 23280ක වැටලීම් ඉලක්කයන් සැලසුම් කරන ලදී එහෙත් 20222 වර්ෂයේ මුල් මාස කිහිපය තුල රට තුල පවතී අර්බුදකාරී තත්වයෙන් (ඉන්ධන නොමැති වීම, රට තුළ පැවති අර්බුදකාරී තත්වය) වර්ෂය තුල වැටලීම් 13980 පමණක් සිදු කිරීමට හැකි විය. එය සැලසුම් කල ඉලක්කයෙන් 60%ක ප්‍රතිශතයකි.

කොළඹ , නුවර, කළුතර, බදුල්ල හා නුවරඑළිය යන බදුල්ල දිස්ත්‍රික්ක වලට ඉලක්ක ලගා කර ගැනීමට ඉහත සඳහන් කරුණු වලට අමතරව නිලධාරී හිගය, වාහන ගැටළු ඇති වීම බලපා තිබුණි.

උදා - කොළඹ,බදුල්ල දිස්ත්‍රික්ක වල විමර්ශන නිළධාරීන් හිගයක් පැවතීම.

මහනුවර දිස්ත්‍රික්කයේ වාහනය අලුත්වැඩියාව සඳහා මාස 02ක කාලයක් පමණ ගත වීම.

(ඊ) ආනයනික හා දේශීය නිෂ්පාදිත භාණ්ඩවල ගුණාත්මකභාවය හා එම භාණ්ඩවලට අදාළ ප්‍රමිති නියාමනය කරන ආයතනවලට සම්බන්ධ තොරතුරු ඇතුළත් පොදු දත්ත පද්ධතියක් සකස් කිරීමෙ උත්සාහ දැරුව ද සියළු නියාමන ආයතනවලින් යාවත්කාලීන වූ දත්ත ලබාගැනීමේ ප්‍රායෝගික අපහසුතා සහ තාක්ෂණමය දෝෂ පැණ නැගුනු අතර ,දත්ත පිළිබඳ තනි වගකීමට නොබැඳෙන නිසා මෙම දත්ත පද්ධතිය සකස් කර එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය .

(උ) ඉහත (ඊ) හි සඳහන් පරිදි මෙම ක්‍රියාවලිය පරිගනක මෘදුකාංගයක් භාවිතයෙන් පරිගණක ආශ්‍රිත ක්‍රම වේදයක් භාවිතා කර සිදු කිරීමට සැලසුම් කළද එම පරිගනක මෘදුකාංගය මිලදී ගැනීම සිදු නොවූ හේතුවෙන් එම ක්‍රියාවලිය සිදු නොවීය.
නමුත් මෙම අත්‍යවශ්‍ය භාණ්ඩ වල සිල්ලර මිල රැස් කිරීමේ ක්‍රියාවලිය වර්ථමානයේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විමර්ශන නිලධාරීන්ගේ සේවය ලබා ගනිමින් සිදු කරනු ලබයි. එමෙන්ම එම මෘදුකාංග (දත්ත පද්ධති) මිලදී ගැනීමෙන් පසු මෙම ක්‍රියාවලිය එම මෘදුකාංග හරහා සිදු කිරීමටද නියමිතය.

(ඌ) පාසල් පාරිභෝගික කව 50ක් පිහිටුවීමට 2022 වර්ෂය තුළ සැලසුම් කර තිබුණද පිහිටුවීමට හැකිවූයේ 7ක් පමණි.
2022 වසර තුළ රටෙහි පැවැති ආර්ථික හා දේශපාලනික පසුබිම තුළ පාසල් වල ඉගැනීවීමේ කාල සටහන් සාමාන්‍ය ක්‍රියාවලියෙන් වෙනස් වූ අතර විෂය බාහිර ක්‍රියාවන් සඳහා ලබාදෙන ලද්දේ ඉතා සීමිත ඉඩකඩක් පමණි.
පාසල් පාරිභෝගික කව පිහිටුවීම පාසලෙහි එකඟතාවය මත පමණක් සිදුකරන කටයුත්තක් වන බැවින් එවැනි තත්ත්වයක් තුළ ඒ සඳහා හිමි වූයේ ඉතා සීමිත අවස්ථාවකි.

(එ) අන්තර්ජාලය හරහා වෙළෙදාම් කරන වෙළෙඳුන් විසින් සිදුකරන අසාධාරණ වෙළෙඳ පිළිවෙත් අවම කිරීම සඳහා අධිකාරිය විසින් 2020 වර්ෂයේ දී මෙකී ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කොට 2021 ජුනි 2022 ,30 මැයි 15 සහ 2022 ඔක්තෝම්බර් 19 යන දිනවල රාජ්‍ය හා පෞද්ගලික කතිකාවක් පවත්වන ලදි .එකී කතිකාවල ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වනවිට අන්තර්ජාලය හරහා වෙළෙදාම් කරන වෙළෙඳුන් නියාමනය කිරීම සඳහා අධිකාරිය විසින් නියෝගයක් නිකුත් කර ඇත) .නියෝග අංක(91

(ඒ) වැඩ තහනම් කිරීම්වලට යටත් වී ඇති පහත නම් සඳහන් නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂය රු. 297,640.56ක් ලෙස වාර්තාවල සඳහන්ව ඇත.

සේවා අංකය	නම	අපදා ණය ශේෂය
191	එන්.ඒ.කේ.එච්. කුමාර මයා	රු. 69,483.28
335	එස්.එන්.එස්.බී.අයි.ටී. ජයසිංහ මයා	රු. 66,666.52
429	ඩබ්.ඩී.බී.එන්. ජයවර්ධන මයා	රු.161,490.76

මෙම වැඩ තහනමට ලක්ව ඇති නිලධාරීන් තුන්දෙනා අතුරින් සේවා අංක 335 සහ 429 දරණ නිලධාරීන් දෙදෙනා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් 2023 වසරේ දී අත්අඩංගුවට ගැනීම නිසා වැඩ තහනමට ලක්ව ඇති අතර, එම වැඩ තහනමට ලක්ව ඇති නිලධාරීන් තිදෙනා ගෙන් දැනට පොත්වල පවතින ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉක්මණින් ගනු ලබන බවට සඳහන් කරමි.

ඒ අනුව, එම අයගේ ආපදා ණය ගිවිසුම්වලට අත්සන් කර ඇති ඇපකරුවන්ගෙන් එම මුදල අයකර ගැනීමට හෝ අවශ්‍ය නීති ක්‍රියාමාර්ග සඳහා කටයුතු කරන බවට වැඩිදුරටත් සඳහන් කරමි.

(ඔ) එක් එක් දිස්ත්‍රික්ක සඳහා නිකුත්කර ඇති උපායදුත අග්‍රිමය භාවිතා කර වැටලීම් සිදුකර එහෙත් නඩු පැවරීම් ප්‍රමාද වූ උපාය දූත මුදල් පවතින බව කළමනාකරණයද හඳුනාගෙන තිබුණි. ඒ පිලිබඳ පසුවිපරම් කිරීමේදී එයට යම් යම් තාක්ෂණික හේතූන් (නඩු භාණ්ඩ විනාශ වීම්, සාම්පල නශ්‍ය වීම් වැනි) බලපෑ ඇත. ඒ අනුව එම මුදල් ප්‍රධාන කාර්යාලයට පියවීම සිදුකරන ලෙස අංක 01/2022/FIN දරන 2022.07.27 දිනැති අභ්‍යන්තර චක්‍ර ලේඛය මගින් දිස්ත්‍රික් ප්‍රධානීන් සහ පළාත් සහකාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත. ඒ අනුව මෙම උපාය දූත මුදල් පියවා ගැනීම් දැනටමත් සිදුවෙමින් පවතින අතර මෙම වර්ෂය අවසාන වන විට එම ශේෂය සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි.

(ඕ) **SICPA SA ආයතනය විසින් පවරා ඇති බෙරුම්කරණ නඩු කටයුත්ත**

අනාරක්ෂිත සහ තත්වයෙන් බාල නිෂ්පාදනයන් වලින් පාරිභෝගික ප්‍රජාව සුරක්ෂිත කරලීම අරමුණු කර ගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් හඳුනාගත් නිෂ්පාදන කිහිපයක් සඳහා ආරක්ෂිත ක්‍රමවේදයක් සැකසීමට තීරණය කර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අංක 1851/1 සහ 2014.02.21 දින දරණ ගැසට් පත්‍රය මගින් විධාන අංක 49 නිකුත් කරන ලදී.

මෙම අනුව ගැසට් පත්‍රය නිකුත් වීමට පෙර හා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගිවිසුම් ගත වීමට පෙර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් තෝරා ගත් භාණ්ඩ සම්බන්ධයෙන් වෙළඳපොල සමීක්ෂණයක් සිදු කර කරන ලදී. මෙයට අමතරව අදාල භාණ්ඩ නිෂ්පාදනය

සිදු කරන ආයතන නිරීක්ෂණය කර ඇති බවත්,ආරක්ෂිත ස්ටිකරය මගින් ව්‍යාජ නිෂ්පාදන වෙළඳපොලට පැමිණීම වැලැක්වීම නිසා නිෂ්පාදනයේ වෙළඳ නාමය ආරක්ෂා වන බවත් පාරිභෝගික ආරක්ෂාව තහවුරු වන බවත් අදාල වෙළෙඳ ආයතන දැනුවත් කර ලිපි යොමු කර ඇත. එසේම CAA/DG /56/2013 සහ 2013 නොවැම්බර් 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමක්ද සිදු කර ඇත. ඒ අනුව ඔබගේ ප්‍රකාශය සමඟ එකඟ විය නොහැකි බව කාරුණිකව දන්වමි.

කෙසේ වුවද ඉහතකී විධාන අංක 49 නිෂ්ප්‍රභා කරවා ගැනීමටත් සහ තවත් ඉල්ලීම් කිහිපයක් මුල් කරගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව ගරු අභියාචනාධිකරණය ඉදිරියේ නිෂ්පාදනය සංගම් විසින් අංක CA/writ/281/14 දරන නඩුව පවරන ලදී. එකී ඉල්ලීම් සළකා බලමින් ගරු අභියාචනාධිකරණය විසින් නඩු විභාගය අවසන් කරමින් අවසාන තීන්දුව ලබාදෙන තෙක් විධාන අංක 49 හි ක්‍රියාත්මකභාවය වළක්වමින් අතුරු නියෝගයක් නිකුත් කල අතර ඒ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට SICPA SECURITY SOLUTION SA සමාගම සමඟ එළඹී ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙන යාමට නොහැකි විය.

ගිවිසුමට අනුකූලව ව්‍යපෘති කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් CA/writ/281/14 දරන නඩුවට අදාල අතුරු නියෝගය පරිදි ගිවිසුමේ පූර්වගාමී කොන්දේසීන් අනුව ඉදිරි කටයුතු සිදු කිරීම අධිකරණයට අපහාස කිරීමක් සිදුවිය හැකිය. ඒ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කිරීමට නොහැකිවීම මත SICPA SECURITY SOLUTION SA සමාගම විසින් ඒක පාර්ශවීයව ගිවිසුම අවසන් කරනු ලැබීය. SICPA SECURITY SOLUTION SA සමාගම විසින් ගිවිසුමේ කොන්දේසීන්ට අනුව මෙම ගැටළුව සම්බන්ධව ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ බේරුම්කරණ නඩු කටයුත්තක් 2018.07.30 දින ගොනුකරන ලදී.

2022.05.10 දින නිකුත් කර තිබූ බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2022.07.07 වන දින කොළඹ වාණිජ මහාධිකරණයේ අංක CHC/626/22/ARB යටතේ පෙත්සමක් ගොනු කර ඇත. ඒ අනුව මෙය ගරු අධිකරණය විසින් විභාග කිරීමට නියමිත වන අතර එකී නඩුව වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිටී.

(ක) 2022 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය වෙත අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලැබුවේ රු .මිලියන 40ක් පමණක් වන අතර අධිකාරියේ අරමුදලින් රු .මිලියන 65ක් වියදම් දැරීමට අනුමත කර තිබිණි .ඒ අනුව මිල ගණන් කැඳවා සියළු කටයුතු අවසන් කොට තිබූ ඒකාබද්ධ දන්ත පද්ධතිය සඳහා අවශ්‍ය

මුදල් මෙමගින් ආවරණය කර ගැනීමටද තීරණය කර තිබුණි .එමෙන්ම අනෙකුත් වියදම් සඳහා අවශ්‍ය මුදල් කොටසක්ද මෙමගින් දැරීමට අදහස් කර තිබුණි .එම හේතු නිසා මෙම ස්ථාවර තැන්පතුව එම ආකාරයෙන්ම පවත්වා ගෙන යන ලදී .කෙසේ නමුත් ඉහත ඒකාබද්ධ දත්ත පද්ධතියේ ටෙන්ඩර්පත් අවලංගු වීමත් සමඟම සහ වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයෙන් අනෙකුත් වියදම් සඳහා මුදල් නිදහස් කිරීමත් යන කරුණු මත එම ස්ථාවර තැන්පතුව වට්ටම් නොකරන ලදී .එම අවස්ථාව වන විට වට්ටම් කොට නැවත ආයෝජනය කලේ නම් වාර්ෂික පොලි අනුපතිකයන්ද අඩු වී තිබූ නිසා එය කල් පිරෙන තෙක්ම තිබෙන්නට ඉඩ හරින ලදී.

(ග) විගණන විමසුමේ සඳහන් මෙම පුරප්පාඩු තනතුරු සඳහා අධිකාරියට කඩිනමින් කටයුතු කිරීමේ බාධා පැවති බව සඳහන් කරමි. ඒ අනුව බඳවාගැනීම් සඳහා සීමා පැවති අතර අදාළ විගණන විමසුම ප්‍රකාශයට පත් කරන විට නිකුත් කර තිබූ මුදල් අමාත්‍යාංශයේ 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සහ 2022.04.26 වන දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් රාජ්‍ය වියදම් පාලනය කිරීම අනුව අධිකාරියට බඳවාගැනීම් සිදුකිරීම ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් පැවතුණි.

කෙසේ වෙතත් 2022.12.31 දිනට පැවති පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසු සේවකයින් බඳවාගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CAA/HRA/Ministry/Rec/2022 හා 2022.10.19 දිනැති ලිපියට අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීමට ඉල්ලුම් කර ඇත

විගණන විමසුමේ සඳහන්ව තිබූ පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කටයුතු) තනතුරු 6ක් සඳහා 2023.05.02 දින සිට එම තනතුරුවල රාජකාරී ආවරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් 6 දෙනෙකු යොදවා ඇත.

තවද, පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) තනතුර සඳහා ස්ථිර සේවකයෙකු පුවත්පත් දැන්වීමක් මගින් සේවයට බඳවා ගන්න ලදී.

තවද, විගණන විමසුමේ සඳහන් පුරප්පාඩුව පැවති නීති හා බලගැන්වීම් නිලධාරී තනතුරු 05

සඳහා මේ වනවිට නීතිඥයින් 05 දෙනෙකු පත්කර එම පුරප්පාඩු ස්ථිරව පිරවීමට කටයුතු සිදුකර ඇත.

විගණන විමසුමේ සඳහන්ව ඇති පරිදි විමර්ශන නිලධාරී තනතුරු 100ක් සඳහා පුරප්පාඩු පවතී. එහෙත් පුරප්පාඩු පැවතුන ද ආයතන සංග්‍රහය, වැටුප් හා සංඛ්‍යාලේඛන කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව එම තනතුරු පිරවීම සඳහා අධිකාරිය විසින් අනිවාර්යයෙන්ම කටයුතු සිදුකළයුුතු නොවන බව සඳහන් කරමි.

ශාන්ත නීරිඇල්ල (ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ)

සභාපති